## කවි කොළය



# කෙරුවා මවක් සිය දරුවා ගඟට බිලී

කටවුට් එකට දහ ගුණයක් හැට දාහේ
වැය කළ මුදල ජන්දය ඉල්ලන වාහේ
ගමකට පාසැලක් ගොඩනැගුමට සෑහේ
ඇස්වල කොරපොතුය හුඟ දෙනෙකුගෙ දෑහේ

බුකිකරු පුතා බණපොත් පළකරන වග
පවසයි ඔහුගෙ මව ජන කරළියට නැග
ජන්දය හිඟාකන මේ පව් පිරුණු ඇඟ
දැය ගොඩනගන සුවිසල් පුරුෂයෙකි යුග

පෙන්වා කෙසෙල් ඇවරිය වැනි සිනා කට
අලවා පෝස්ටර් උනුනුන් එකා පිට
බල්ලන් වගේ පොර ඇල්ලුව මනා පෙට
දුන්නද ඔබත් ජන්දය ඒ **තුමා** ලට?

දුටුවිට රූපවාහිනියෙහි සං වාද
සිහියට නැගෙයි මේ අය දෙවියන් නේද
පව ගස්වලට ඇවිදින හතරෙන් පාද
රැවටී මේ වරත් ජන්ද දුන් නාද?

"මම හිතවතා වන්නෙමි දුප්පතා ගේ
ජන්දය මටයි කුස්සියෙ බවලතා ගේ"
බෙට්ටෙන් සයිස් එක කිවහැක සතා ගේ
දළ බිම ඇනී ඇත මෙවරත් ඇතා ගේ

සීමා කළත් තිස්පහකට ඇමති වරු
පිරිසක් තවත් එති කැබිනට් නොවන ගරු
සිදුවෙයි වමාරන්නට අතහැරිය බොරු
පැරදුන එකාටත් මෙය කාලයකි සරු

ජන්දෙට කෝටි හැට ගණනක් නැතිව මැලි
වියදම් කරන මිනිසුන් පිරි රටක ජොලි
දුප්පත්කමේ අන්තිම පතුලටම ගිලි
කෙරුවා මවක් සිය දරුවා ගඟට බිලි

අපිටත් අමාරුයි
තුන් වේලම කන් ට
මියගිය අමිල වැනි
දරුවන් රැකගන් ට
වැඩපිළිලෙක් කල්
නොයවා අරඹන් ට
සැලකර සිටින්නෙමි
මහ රජ්ජුරුවන් ට



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**

# මවක් දරුවා ගඟට වීසිකරයි

**පා**නදුරේ පළාතේ වෙසෙන මවක් තම දරුවන්ගේ කුසගිනි නිවන්නට ආහාර සපයාගන්නට නොහැකිකම නිසා කළකිරීමට පත්ව වයස අවුරුදු 2 යි මාස 8 ක් වූ අමිල සඳරුවන් නමැති බාලම පිරිමි ළමයා කළුතර බෝධිය අසලදී පාලමෙන් කළුගඟට විසිකිරීමේ පුවතක් පසු ගිය මස ශ්‍රීලංකාවේ අසන්නට ලැබුණු ඛේදවාචකයකි. සුනාමි ව්‍යසනයට අසුව පීඩාවට පත්ව සිටි ඇය දිවි ගැටගසාගත්තේ ලොතරැයි ටිකට් විකිණීමෙනි. ඒ කාන්තාව ගේ අනෙක් දරුවන් තිදෙන ළමා නිවාසවලට බාරදෙන ලෙස කළුතර උසාවියේ මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරන ලදී.



**අමිල සඳරුවන්**

දැනට රිමාන්ඩ් බාරයේ සිටින තිස් වියැති මෙම කාන්තාව පොලීසි යට පවසා ඇත්තේ ළමා හා පරිවාස දෙපාර්තමේන්තුවට ළමයා බාරදෙන්නට ගත් උත්සාහය පලක් නොවූ බවයි. එසේම කාට හෝ දරුවා බාරදෙන්නට මහන්සි ගත්තද කිසිවෙකු ඊට කැමැත්තක් දක්වා නැත. කලුතර බෝධිය ළඟට දරුවා ගෙන ගොස් ඇත්තේ ඔහු එහි තනිකර දමා යන්නට ය. බෝධිය ළඟට නිතර පැමිණෙන සෙනග අතරින් කවරෙකු හෝ දරුවා රැගෙන යාවියැයි ඇය සිතුවා ය. එහෙත් එය ද සිදු නොවී ය. දරුවා හඬමින් මව පසුපසම එන්නට වූයේ ය. කාගෙන්දෝ ලැබුණු බත් පාර්සලයක් දරුවාටද දී, තමා ද කා අවසන්කොට, කලුතර පාළම උඩින් යද්දී දරුවා නිදි කිරා වැටෙමින් සිටියේය. ඒ අතරේ දරුවා ගඟට දැමිය යුතුයයි ඇයට සිතක් පහළ විය. මේ ඇය පොලීසියට හෙළිකළ කරුණුය.

ගඟේ පාවෙන දරුවෙකුගේ සිරුරක් දුටු පාලම පසුකර ගිය තරුණයන් පිරිසක් ගඟට පැන දරුවා ගොඩට ගත් නමුත් ඒ වනවිටත් වතුර පෙවී සිහිසන් නැතිව සිටි දරුවා අසාධ්‍ය තත්වයේ වූයේය. වහාම දරුවා බොරැල්ලේ ළමා රෝහළට ගෙන යන ලදී. වෛද්‍යවරු ඔහු බේරාගන්නට අනේක උත්සාහයක් දැරුවත් දින කීපයකට පසු අමිල සඳරුවන් නමැති ඒ ළමයා මියගියේය.

# දේශපාලකයා නොදකින රටේ සැබෑ තත්වය

**ග**තවුණු මැතිවරණයට (සහ මීට පෙර පැවති සියළු මැතිවරණවලටද) අප රටේ දේශපාලකයින් විසින් වියදම් කරනලද මුදල් කන්දරාව කොපමණකැයි ඔබ සිතනවාද? රට පුරා යෝධ කටවුට්, පෝස්ටර්, බැනර්, අත්පත්‍රිකා, පුවත්පත් දැන්වීම් ආදී මේ සියලු ප්‍රචාරක ක්‍රියාවන් සඳහා ද, රැස්වීම් සංවිධානය ආදියට ද, වාහන පාවිච්චිය සඳහා ද වියදම් කළ මුදල් ප්‍රමාණය සිතන්නටවත් බැරිතරම්ය. ඔවුන්ගේ කටේ ඇත්තේ සංවර්ධනය යන වචනයයි. එසේම ජනතාවට යහපත් හෙටක් උදාකර දෙන බවයි. සියළුම පක්ෂවල දේශපාලකයින්ගේ කතාබහ ක්‍රියාපටිපාටිය මෙසේ වචනයට පමණක් සීමාවෙද්දී රටේ බහුතරයක් එදිනෙදා වේල පිරිමහගන්නේ මොනතරම් අමාරුවෙන්දැයි විස්තර කළයුතු නැත. මේ ඉහත සඳහන් වන ඛේදනීය පුවත ලංකා දේශපාලකයාගේ ඒ කුහක වත හෙළිකරන සාක්ෂියකි.

රටක දේශපාලනය ඒ රටේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා නොවේ නම්, ඒ දේශපාලනය ජනතාවගේ දැවෙන ප්‍රශ්න නොසලකා හරිනවා නම් එවැනි දේශපාලකයින් රටකට කුමකට ද? – **කීර්ති**

# S.Lanka president offers healing help to football ace David Beckham

COLOMBO (AFP) - Sri Lanka's president has offered the services of his spiritual healer and personal physician to help injured footballer David Beckham get back on the field within three days. Eliyantha Lindsay White, 37, President Mahinda Rajapakse's personal physician, told AFP that the former England captain had been invited for treatment involving "faith and ayurveda."




An official at the president's office said it had sent an invitation to Beckham to visit the island for traditional treatment after a string of Indian sports stars claimed they were helped by White."I am ready to treat him," White said. "His condition can be easily treated and within three days he will be able to go back to playing."Doctors have ruled out Beckham playing for several months after the player ruptured his Achilles tendon earlier this month."His case is simple. I can treat him. He can play again," said White, who claims he has special "powers" that he uses, blended with traditional ayurvedic treatment practised in Sri Lanka and neighbouring India.

Star Indian batsman Sachin Tendulkar hit a record double century against South Africa last month and publicly thanked Rajapakse for giving him the services of White to treat him for a knee injury. White has since treated three more Indian cricket players, including opening batsman Gautam Gambhir and left-arm bowler Ashish Nehra who travelled to Colombo last week for treatment by White.



**ඉරිදා – SUN** මේ දිනපොත අද ලියන්න පටන්ගත්තෙ ලංකාවෙ ලබන සතියෙ පැවැත්වෙන ඡන්දෙ ගැන හිත හිත. ආතර් මාම තමයි එහේ වෙන හැම විස්තරයක්ම අපට දෙන්නෙ. වේදිකා දෙවනත් වෙන්න කථිකයො බෙරිහන් දෙනවා. කාලයක් තිස්සෙ මෙහේ එංගලන්තෙ යුරෝපෙ පැවැත්වෙන ඡන්ද දැකලා ඇති මම හැම තිස්සෙම හිතපු දෙයක් තමයි ඒ එහේ මැති ඇමතිවරු, අපේක්ෂකයො ලවුඩ්ස්පීකර් එකෙන් කතාකරනකොට ඇයි එච්චර කෑගහන්නෙ කියලා. ඇයි කලබල නැතුව සන්සුන්ව හිමින් කතාකරන්න බැරි? සේරම කථිකයො එකම විදියට බොහොම ආවේග යෙන් කෑගහනවා. දැන් විතරක් නෙවෙයි ඉස්සරත් එහෙමයි. ඡන්දෙ ඉල්ලන හාමුදුරුවරුත් එහෙමයි බණ දේශනා කරනකොට තියන ඒ ශාන්ත ගතිය ඇත්තෙ නැහැ. මේකට හේතුව මොකක්ද කියලා කවුරුවත් දන්නෙ නැහැ.

**සඳුදා – MON** දැන් ලංකාවෙ අළුත්ම මෝස්තරේ තමයි යාපනේ සංචාරෙ යන එක. ගිය සුමානෙ මම තලවකැලේ නැන්දම්මට කතාකරපු වෙලාවෙ කිව්වා, දුවේ අපි මේ යාපනේ ගිහිං ඊයෙයි ආවෙ කියලා. කොටියන්ට බිම් බෝම්බ වලට බයේ මෙපමණ කලක් දකුණේ කවුරුවත් යාපනේට ගියේ නැහැ. දැන් සිංහළ මිනිස්සු බය නැතුව යනවා. වෙළදාම් කරනවා. සංචාරකයො යනවා. කාලෙකට පස්සෙ මේ ඡන්දෙට දකුණේ දේශපාලකයො ගිහිං යාපනේ වේදිකාවල කතාකෙරුවා. ඒත් පරණ ඊළම්කාරයින්ට ඕන උතුරයි දකුණයි වෙන්කරලා තියන්න. සිංහළ මිනිස්සුත් එක්ක අශ්‍රයට යන්න එපා කියලා යාපනේ දෙමළ මිනිස්සුන්ට සම්බන්ධන්ලා කියනවා කියලා පත්තරවල තිබුණා. අපිට යාපනේට එන්න බැරිනම් උඹල කොහොමද කොළඹ වැල්ලවත්තෙ කොටහේනෙ ඉන්නෙ? කියලා ඇයි සිංහළ අය කට ඇරලා අහන්නෙ නැත්තෙ?

**කුජදා – TUE** එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන්කී මූන් ලංකාවට විරුද්ධව යුද අපරාධ චෝදනා ගේන්න ආයිත් මහන්සි ගන්නවා. මේ සේරම පිටිපස්සෙ ඉන්නේ ඇමරිකාවයි එංගලන්තයයි. උන්ගෙ පිටිපස්සෙ ඉන්නෙ දෙමළ ඊළම් ඩයස්පෝරාව. ඇමරිකාව වියට්නාමෙ විනාස කෙරුවා. ඉරාකෙ විතරක් ලක්ෂගණනක් සිවිල් ජනතාව බෝම්බදාලා මැරුවා. ලක්ෂ ගණනකට උන්හිටිතැන් නැතිකෙරුවා. ඒවට ඔහ සමුළුවෙ එකෙක්වත් කවදාවත් ඇමරිකාවට විරුද්ධව වචනයක් කියලා නැහැ. පත්තරවල තිබුණා ලංකාවෙ පිරිසක් යන්න ලෑස්ති වෙනවයි කියලා මූන් හම්බ වෙන්න. මේ ප්‍රශ්නෙ කතාකරන්න. ආතර් මාම කියනවා ඒ පිරිසට ඇමති මර්වින් සිල්වා යැවිය යුතුමය කියලා. මර්වින් මූන්ගෙ කනට කරලා යමක් කියාවිය, එතනින්ම ප්‍රශ්නෙ ඉවරය කියලා.

**බුදදා- WED** ලංකාවට හැමදාම තිබුණු ප්‍රශ්නයක් ගෙවල් ප්‍රශ්නෙ. ඒ කියන්නෙ නිවාස හිඟකම නෙවෙයි, ගෙයක් කුලියට දුන්නම ඒ මිනිස්සු ගෙයින් යන්නෙ නැතුව ගෙට අයිතිවාසිකම් කීම. සෝමතුංග බාප්ප මැද පෙරදිග රස්සාවට ගිහින් මහන්සි වෙලා දුක්විඳලා හම්බ කරන් ආපු සල්ලිවලින් මහරගම වත්තෙගෙදර ගෙයක් හැදුවා. ඒක කුලියට දීලා ආයිත් ඩුබායි ගියා අවුරුද්දකට. දැන් අර කුලියට ඉන්න ඇයො කියනවා ගෙයින් යන්න බැරිය කියලා. අවුරුද්දකින් ගෙවල් කුලී දීලත් නැහැ. ළඟදි ඇමති කෙනෙක් සමුළුවකදි කිව්වලු හැම කෙනෙකුටම රජයෙන් ගෙයක් හදලදෙනව කියලා. සෝමෙ බාප්ප ඇමතිට කිව්වලු, අපට අලුතින් ගෙවල් එපා මේ මිනිස්සු ටික ගෙයින් එළවලා දෙන්න කියලා.

**ගුරුදා - THU** මේපාර නළුනිළියො, ක්‍රිකට් මලල ක්‍රීඩකයො, ක්‍රීඩිකාවො, කලාකාරයො ලංකාවෙ මැතිවරණෙට තරඟ වදිනවා. මම හිතන්නෙ නැහැ ඒක එච්චර හොඳ දෙයක් කියලා. දේශපාලකයො වගේ නෙවෙයි මේ අය රටේ ජනතාවගේ ආදරය ලබපු පිරිසක්. දේශපාලනේ කියන්නෙ මහා මඩවගුරක්. කොච්චර සුදුපාටින් බැබලි බැබලි හිටියත් මඩට බැස්සොත් මඩ ගෑවිලා මිසක් ආයිත් සුදෙන් ගොඩට එන්න හම්බවෙන්නෙ නැහැ. අනෙක දේශපාලනේ වැඩිපුරම ලැබෙන්නෙ බැණුම්. තම තමන්ගෙ පුද්ගලික ජීවිතෙත් එළිදරව් වෙනවා. විරුද්ධ පාක්ෂිකයො නැති බොරුත් හදල කියනවා. මේවට මේ අළුත් කස්ටිය ඔරොත්තු දේවි කියලා හිතන්න අමාරුයි.

**කිවිදා- FRI** රටක සෑම දේශපාලන පක්ෂයක්ම ඒ රටේ පොදු යහපත ගැන හිතන්න ඕන. මොන බොරුව කියලා හරි ආසන දිනා ගන්න නෙවෙයි. හැම පක්ෂයක්ම සාමුහිකව රට ගැන හිතන්න ඕන. පහුවුණු යුද්දෙදි කවුරු රට බේරගන්න කටයුතු කළාද නැද්ද කියලා ලංකාවෙ ජනතාව දන්නවා. එම දැනුම නිසාම අද යූ ඇන්පී පක්ෂයෙන් ජනතාව ඈත්වෙලා. ආයිත් ඒ පක්ෂය ගොඩ ගන්න බැහැ. මේ අට වෙනිදා මැතිවරණේදි ඒක තවත් හොඳට පෙනේවි. රනිල් මහත්තෙයා පුද්ගලයෙක් හැටියට හොඳවෙන්න පුළුවන්. ඒත් දේශපාලකයෙක් හැටියට අන්තිම පණ මදි. පක්ෂ නායකයෙක් කියන්නෙ ගහක මුදුන් මුලක්. ඒ මුල දුබල නම් ගහ කඩා වැටෙනවා.